සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 6 - 2017

**නම : ............................................... ක්‍රිස්තු ධර්මය කාලය : පැය 2යි.**

## I කොටස

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
❖ **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ශු.බයිබලයට අනුව මැවිල්ලේ උතුම්ම ස්ථානය හිමිකර ගන්නේ,
(i) අහස ය. (ii) පොළව ය. (iii) ජලය ය. (iv) මිනිසා ය.

(2) දේව මැවිල්ල පිළිබඳව ශු.බයිබලයේ සඳහන් වන ග්‍රන්ථය වන්නේ,
(i) උත්පත්තිය ය. (ii) නික්මයාම ය. (iii) ශු.මතෙව් ය. (iv) ශු.ජොහාන් ය.

(3) ස්නාවක ජෝහාන්තුමාගේ දෙමාපියන් වන්නේ,
(i) ආබ්‍රහම් හා සාරා ය . (ii) ආබ්‍රහම් හා ජෙකොබෙද් ය.
(iii) එලිසබෙත් හා සෙකරියස් ය. (iv) එල්කානා හා හන්නා ය.

(4) ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ දිනය අප හඳුන්වන්නේ,
(i) මහ බ්‍රහස්පතින්දා ලෙස ය. (ii) මහ සිකුරාදා ලෙස ය.
(iii) අලු බදාදා ලෙස ය. (iv) පාස්කු ඉරිදා ලෙස ය.

(5) සහනාධාර කටයුතු සඳහා පත් කරන ලද උපස්ථායකයින් අතර ප්‍රධානියා වූයේ ,
(i) පිලිප් තුමා ය. (ii) ස්තේපන් තුමා ය. (iii) පේදුරු තුමා ය. (iv) පාවුල් තුමා ය.

❖ **අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න.**

(6) දෙවියන්වහන්සේ තම ස්වරූපයට අනුව මිනිසා මැවූ සේක. ( )

(7) පෙන්තකෝස්ත මංගල්‍යය සැමරීම සඳහා අවුරුදු දොළහේදී ජේසු කුමරු ජෙරුසලමට ගිය සේක. ( )

(8) ක්‍රිස්තුස් වහන්සේ තම සේවය ආරම්භ කිරීමට පෙර දින හතරක් උපවාසයෙන් කාලය ගත කල සේක ( )

(9) ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය තුළින් අපට සදාකාල ජීවනය හිමි වේ. ( )

(10) අපේ ජීවිත නිවැරදි කරගෙන පාපයෙන් මිදී ජීවත්වීම කිතුණු අපේ වගකීමයි. ( )

❖ **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල A කොටසේ දැක්වෙන වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A කොටස | B කොටස |
|---|---|---|
| (11) | දාවිත්ගේ පුත් ජේසුස් වහන්සේ මට අනුකම්පා කරන්න යැයි පැවසුවේ | එතියෝපිය නපුංසකයා ය. |
| (12) | සදාකාල ජීවනයේ උරුමය ලබා ගැනීමට මා කුමක් කළ යුතු දැයි ඇසුවේ | බාර්ති මෙයස් ය. |
| (13) | යමෙක් මට මග පෙන්නුවොත් මිස මට තේරුම් ගත හැක්කේ කෙසේදැයි පැවසුවේ | ජේසුස් වහන්සේ ය. |
| (14) | මා පියාණන් වහන්සේගේ මැදුරේ සිටිය යුතු බව ඔබ නොදන්නෙහි දැයි විචාලේ | යක්ෂයා ය. |
| (15) | ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතනින් පහළට පනින්න යැයි පැවසුවේ | විනයධරයා ය. |

❖ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශවල හිස්තැන වරහන් තුළ දී ඇති පිළිතුරු යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

(කිරේනියේ සීමොන්, ජෙරුසලම, සමාරිය, ස්නේපන්තුමා, ගාබ්‍රියෙල්, මිඛායෙල් එම්මාවුස්, උපස්ථායක පිලිප්තුමා)

(16) දෙවියන් වහන්සේට සේවය කරන සුභ ආරංචි ගෙනෙන දූතයා වන්නේ .............................දේව දූතයා ය.

(17) ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යෑමට උපකාර කළේ ........................... ය.

(18) .............................. ගමනේදී ජේසුස් වහන්සේ ක්ලෙයෝපස් හා තවත් ශ්‍රාවකයෙකු මුණ ගැසුණි.

(19) ............................. එතියෝපීය නපුංසකයාට දේව වචනය පැහැදිලි කිරීමට ඉදිරිපත් විය.

(20) ජුදෙව්වන් හා ........................... ජාතීන් අතර බොහෝ කලක සිට මුල් බැසගත් වෛරයක් විය.

( ලකුණු 2 x 20 = 40 )

## II කොටස

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) කිතුණු අප පාස්කු මංගල්‍යය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

(ii) එම්මාවුස් ගමනේදී ක්ලෙයෝපස් හා අනෙක් ශ්‍රාවකයා ජේසුස්වහන්සේ හඳුනාගන්නේ කුමන අවස්ථාවේදි ද?

(iii) පාපය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ''ඒලී ඒලී ලාමා සබස්තානි'' ලෙස ජේසුස් වහන්සේ කළ ප්‍රකාශයේ අර්ථය කුමක් ද?

(v) ජේසුස් වහන්සේ නිසි ලෙස හඳුනා ගැනීමට එඬේරුන්ට දුන් සලකුණු කුමක් ද?

(vi) පස්වන දවසේ දෙවිඳුන් මවනු ලැබූ දේවල් නම් කරන්න.

(vii) ඉරුදින පාසලෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න?

(viii) දෙවිඳුන් හඳුනන දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2 x 8 = 16 )

(2) (i) ස්නාවක ජොහාන්තුමා බෞතිස්ම ස්නාපනයට යොදා ගත් ස්ථානය කුමක් ද? (ලකුණු 2)

(ii) ජේසුස් වහන්සේ බෞතිස්මයේදී ස්වර්ගය විවර වී නැගුණු හඬ ශබ්දය කුමක් ද? (ලකුණු 3)

(iii) බෞතිස්ම ස්නාපනය ලැබූ කිතුනු දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග හයක් ලියන්න? (ලකුණු 6)

(3) (i) යහපත් සමාරිතයාගේ උපමා කථාවේ තුවාල වූ තැනැත්තාට උදව් නොකර මගහැර ගිය පුද්ගලයින් දෙදෙනා නම් කරන්න. (ලකුණු 2)

(ii) යහපත් සමාරිතයා තුවාල වූ තැනැත්තා වෙනුවෙන් කළ ක්‍රියාවන් තුනක් ලියන්න. (ලකුණු 3)

(iii) යහපත් සමාරිතයාගෙන් අපට ගත හැකි ආදර්ශ තුනක් ලියා දක්වන්න. (ලකුණු 6)

(ලකුණු 11)

(4) (i) යක්ෂයා විසින් ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ පරීක්ෂා ගණන කීයද? (ලකුණු 2)

(ii) එම පරීක්ෂාවන්ගෙන් එකක් ලියා, ඊට ජේසුස් වහන්සේ දුන් පිළිතුර ලියන්න. (ලකුණු 3)

(iii) ඔබට පැමිණෙන පරීක්ෂාවන් තුනක් ලියන්න. (ලකුණු 6)

(5) (i) ක්‍රිස්තුස් වහන්සේ කුරුසි පත් කළ දිනය අප හඳුන්වන්නේ කුමන නමකින් ද? (ලකුණු 2)

(ii) කිතුනු උත්ථානයට සාක්ෂි දැරූ පුද්ගලයින් තුන් දෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

(iii) කිතු දහම තම මිතුරන්ට ප්‍රකාශ කිරීමට ඔබ කටයුතු කළ යුත්තේ කෙසේ දැයි වාක්‍ය 6කින් ප්‍රකාශ කරන්න. (ලකුණු 6)

(6) (i) ඇදහිල්ල නිසා සුවය ලැබූ අන්ධ පුද්ගලයා නම් කරන්න. (ලකුණු 2)

(ii) ඇදහිල්ලෙන් ඔබට ලැබෙන වරප්‍රසාද තුනක් නම් කරන්න. (ලකුණු 3)

(iii) අන්ධ පුද්ගලයෙකු ඔබට හමු වූ විට ඔබ ඔහුට උදව් කරන ආකාර තුනක් ලියා දක්වන්න. (ලකුණු 6)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

## ක්‍රිස්තු ධර්මය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| (1) - 4 | (6) - ✓ | 11 - බාර්තිමෙයස් | 16 - ගාබ්‍රියෙල් | |
| (2) - 1 | (7) - ✗ | 12 - විනයධරයා | 17 - කිරේනියේ සීමොන් | |
| (3) - 3 | (8) - ✗ | 13 - ඉතියෝපිය නපුංසකයා | 18 - එම්මාවුස් | |
| (4) - 4 | (9) - ✓ | 14 - ජේසුස් වහන්සේ | 19 - උපස්ථායක පිලිප් තුමා | |
| (5) - 2 | (10) - ✓ | 15 - යක්ෂයා | 20 - සමාරිය | |

(ලකුණු 2 x 20 = 40 )

### II කොටස

(1) (i) ජේසුස් වහන්සේගේ උත්ථාන වීම.
(ii) ඔවුන් සමඟ හිඳ රොටි ගෙන ආශිර්වාද කොට ලබා දුන් විට
(iii) දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටුපා ක්‍රියා කිරිම
(iv) මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද
(v) රෙදි වලින් ඔතා ගවයන් කන ඔරුවක තබා සිටින බිලිදෙක්
(vi) ජලජ සතුන් හා පක්ෂින්
(vii) දහම ඉගෙනීම , දෙවිඳුන්ට ළං වීමට හැකි වීම
(viii) ඉවසීම , දරාගැනීම , ප්‍රේමය
(ලකුණු 2x 8 = 16 )

(2) (i) ජෝර්දාන් නදිය.
(ii) ඔබ මාගේ පියාදර පුත්‍රයාණෝය ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි.
(iii) ශිෂ්‍ය පිළිතුර සලකා බලා ලකුණු දෙන්න.
( ලකුණු 2 +3+ 6 = 11 )

(3) (i) පූජකයා, ලෙව්වරයා
(ii)
- තුවාල සෝදා තෙල්,මිදි යුෂ ගැල්වීම.
- තම කොටලුවා පිට හිඳවාගෙන යාම.
- තානායමට රැගෙන යාම, භාර දීම, මුදල් දීම.

(iii)
- තරාතිරම නොබලා උදව් වීම.
- තමා සතු සම්පත් අන් අයගේ අවශ්‍යතා වෙනුවෙන් වැය කිරිම.
- ප්‍රති උපකාර අපේක්ෂාවෙන් තොරව උදව් වීම. ( ලකුණු 2 +3+ 6 = 11 )

(4) (i) 3 යි
(ii) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න
(iii) බොරු කීම
කේලම් කීම
සොරකම් කිරීම .... ආදී පිළිතුරු වලට ලකුණු දෙන්න
( ලකුණු 2 +3+ 6 = 11 )

(5) (i) මහ සිකුරාදා
(ii) මග්දලාවේ මරියා, ජෝවන්නා , ජාකොබ්ගේ මව් වූ මරියා . පේදුරු එම්මාවුස් ගමන ගිය ගෝලයෝ තෝමස් ...
(iii) ශිෂ්‍ය පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. ( ලකුණු 2 +3+ 6 = 11 )

(6) (i) බාර්තමේයස්
(ii) සුවය, සවිය, දිරිය, සහනය , රැකවරණය
(iii) මග පෙන්වීම, කෑම බීම දීම , උපකාර අවශ්‍ය කාරණය විමසා උදව් වීම වැනි පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.
( ලකුණු 2 +3+ 6 = 11 )